
වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

01-04-2020---31-03-2021



මාන්තායි සෝල්ට් ලිමිටඩ්

மாந்தை உப்பு லிமிற்றெட்

MANTAI SALT LIMITED

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

மாந்தை சோல்ட் லிமிட்டெட்

MANTAI SALT LIMITED

Ministry of Industries

රජයට අයත් සමාගමකි

அரசுக்குச் சொந்தமான கம்பனி

Government Owned Company

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

2020.04.01 – 2021.03.31

1. සභාපතිවරයාගේ සමාලෝචනය

ජාතික ලුණු සමාගමෙහි වත්මන් සභාපතිවරයා වශයෙන්, මම 2020/2021 වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික ගිණුම් පිළිබඳ මගේ සමාලෝචනය මෙයින් ප්‍රකාශ කරමි. සමාගමේ 2020/2021 වාර්ෂික මහා සභා රැස්වීමට ඔබව සාදරයෙන් පිළිගනිමින් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

සමාලෝචිත වර්ෂය තුළ මාන්තායි ලුණු සමාගමෙහි පිරිවැටුම රු. 201,568,231ක් උපයාගෙන ඇති අතර උත්පාදිත බදු පෙර ලාභය රු. 70,168,530 කි. ආරම්භයේ සිට අපගේ කාර්ය සාධනය දෙස පසු විපරම් කිරීමේ දී, රුපියල් 12,298,244 ක බදු පෙර ලාභයක් උපයා ගනිමින් එය 2019/2020 පිරිවැටුම වන 103,473,982 සමඟ සංසන්දනය කිරීමේ දී අපගේ ජයග්‍රහණ සාධාරණීකරණය කළ හැකි ලෙස උද්දාමයට පත් විය හැකිය. ප්‍රවර්තන වර්ෂය වන 2020/2021 වර්ෂයේ නිෂ්පාදන සහ වෙළඳ කටයුතු කැපී පෙනෙන දියුණුවක් පෙන්නුම් කළ අතර සමාගම විසින් රජයේ බදු ලෙස ගෙවා ඇති මුදල රු. 10,539,502කි.

ශ්‍රී ලංකාවේ සාර්ථකව ලුණු කර්මාන්තය දියුණු කිරීම මෙන්ම පවත්වා ගෙන යාමට පහසුකම් සපයන්නා ලෙස සමාගමට හැකි වූ බව කොටස් හිමියන්ට වාර්තා කිරීමට මම සතුටු වෙමි. 2020/2021 වසර තුළ ලබා ගත් ප්‍රතිඵල අනුව කොටසක ඉපැයීම් රු. 200.56 කි

වර්ෂය සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 167 කි. 2021.03.31 වන විට සිටින ස්ථිර සේවක සංඛ්‍යාව 57 කි. සෑම තරාතිරමකම සිටින සියලුම සේවකයින්ගේ පූර්ණ සහයෝගය අප වෙත අඛණ්ඩව ලැබෙන බව සටහන් කිරීම සතුටට කරුණකි.

ජාතික ලුණු සමාගම විසින් අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා නව කොටස් ප්‍රාග්ධනය හරහා එහි වර්තමාන ප්‍රාග්ධන පදනම ශක්තිමත් කළ යුතුය.

කෙසේ වෙතත්, නව සභාපතිවරයෙකු ලෙස, මම 2022 පෙබරවාරි මාසයේ රාජකාරි භාර ගනිමි. මා රැස් කර ඇති දත්ත වලට අනුව, ලුණු දෙපාර්තමේන්තුවෙන් ආරම්භ වූ දා සිට, අගය එකතු කිරීම හැර අනෙකුත් අමු ලුණු විකිණීම කෙරෙහි සමාගම අවධානය යොමු කර ඇත. මේ වන තෙක් මේස ලුණු වෙළෙඳපොළ වෙත නිෂ්පාදනය කර වෙළඳපොල වෙත නිකුත් කිරීමට අපට නොහැකි වී ඇත. එබැවින්, අගය එකතු කළ නිෂ්පාදන ආරම්භ කිරීම මගේ ප්‍රධාන රාජකාරී පරිපථය වන අතර ඊට අමතරව මාගේ සභාපතීත්වයෙන් යුතුව පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. වඩාත් ඵලදායී සේවාවක් සාක්ෂාත් කර ගැනීම උදෙසා ආංශික පදනමින් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම.

2. නව තාක්ෂණය භාවිතා කිරීම තුලින් පවත්නා ඉඩම් ප්‍රමාණය යොදා ගනිමින් නිෂ්පාදනය ඉහල නංවා ගැනීම සඳහා සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගත් අවශ්‍ය ක්‍රියාමාර්ගග

3. ලුණු ලේවායන් හි සියලුම භාවිතා නොකළ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර මා විසින් ගෙන ඇත.

4. අගය එකතු කිරීමේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරමින්, ඉතාමත් කඩිනමින් මේස ලුණු පැකට්ටුවක් වෙළඳපොල වෙත හඳුන්වා දීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

5. අපනයන වෙළෙඳපොල සහ ආහාර කර්මාන්තය ඉලක්ක කර ගනිමින් PVD ලුණු යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම මගින් සැකසූ ලුණු වල ප්‍රමිතිය ඉහල නැංවීම සහ ISO තත්ත්ව සහතිකය ලබා ගැනීම.

6. දිවයින පුරා විහිදී ගිය බෙදාහැරීමේ ජාලයක් ක්‍රියාත්මක කිරීම.

7. උපරිම වෙළෙඳපොල කොටස ලබා ගැනීම සහ දේශීය වෙළෙඳපොලෙහි අංක 1 වෙළෙඳ සන්නාමය බවට පත්වීම. වැඩි පිළිගැනීමක් ඇති කර ගැනීම සඳහා වෙළෙඳ සන්නාමය ‘‘ජාතික ලුණු’’ ලෙස වෙනස් කිරීමට යෝජනා වී ඇත.

8. ජාතික ලුණු සමාගමෙහි තිරසාරබව උදෙසා කුරින්චතිවු ලුණු ලේවායෙහි සංවර්ධන සහ මෙහෙයුම් කටයුතු ජාතික ලුණු සමාගම යටතට ගෙන සිදු කිරීම.

9. කොටස් හිමිකරු එනම් මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලාභාංශ ප්‍රමාණය වැඩි කිරීම

10. ලුණු ලේවාය සම්පූර්ණ ධාරිතාවෙන් යුතුව මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා සේවක සංඛ්‍යාව සම්පූර්ණ කිරීම, විනය කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කිරීම සම්පූර්ණ කිරීම සහ ජාතික ලුණු සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා සුභ සාධන පහසුකම් ඉහල නැංවීම මෙන්ම දිරි දීමනා යෝජනා ක්‍රමයක් සකස් කිරීම.

ගරු අමාත්‍යවරයා, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සහ කාර්ය මණ්ඩලය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය ආයතන මෙන්ම පාරිභෝගිකයන් වෙත අපගේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාව කර ගනිමු.

එබැවින්, ජාතික ලුණු සමාගම සියලු අභියෝග ජය ගනිමින් අපගේ සේවා ලාභීන් වෙත අඛණ්ඩ සාර්ථක සේවා සැපයීම සඳහා කැපවී සිටිමු.

ජාතික ලුණු සමාගමෙහි සියලු සේවයේ නිරත වූ සභාපතිවරුන්ට; විශේෂයෙන් ම පූර්ව සභාපති ධුරන්දර එච්. ජී. විජේතුංග මහතාට මගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාව කරගන්නා අතර මා වෙත ලබා දෙන ලද සහාය සිහිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සහෝදර සහෘදයින් සහ කළමනාකරණ තලයේ සිටින්නා වූ ත් කාර්ය මන්ඩලයේ නියුතු වූ ත් සියලු දෙනා වෙත මගේ කෘතඥතාව පිරිනමමි.

ජාතික ලුණු සමාගම සියලුම අභියෝගකරුවන් හමුවීමට සූදානම් වන අතර අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඳහා ඉක්මනින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දක්වන අතර එමඟින් එහි අඛණ්ඩ සාර්ථකත්වය සහතික කරයි.

එම කාලය තුළ NSL හි සේවය කළ හිටපු සභාපති එච්.ජී. විජේතුංග මහතාට තම දායකත්වය ලබා දුන් සියලුම සභාපතිවරුන්ට සහ මා වෙත ලබා දුන් සහාය සඳහා මණ්ඩලයේ මගේ සගයන්ට සහ කළමනාකාරිත්වයට සහ කාර්ය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පුද කරමි.

ඒ.පී. මොරගොඩ

සභාපති

2. සාමාන්‍යාධිකාරීවරයා ගේ පණිවුඩය

2020 අප්‍රේල් මස 1 දින සිට 2021 මාර්තු මස 31 දින දක්වා කාලය තුළ මාන්තායි ලුණු සමාගම විසින් සිය කටයුතු සහ ක්‍රියාකාරකම්, වඩාත් ප්‍රගාමීව ඉටු කළ බවත් ඒ ඔස්සේ ලාභ ඉපැයූ බවත් වාර්ෂික මහා සභා රැස්වීමේදී මගේ පණිවිඩය මගින් ප්‍රකාශ කිරීමට ලැබීම මා ලද කදිම අවස්ථාවක් ලෙස සලකමි.

වර්තමාන මූල්‍ය වර්ෂයේදී මන්නාරම ලුණු ලේවාය සහ අලිමංකඩ ලුණු ලේවාය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. 2015 ජනවාරි 15 වැනි දින අංක 1897/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව අලිමංකඩ ලුණු ලේවායේ පරිපාලනය 2015 පෙබරවාරි මස සිට නැවතත් මාන්තායි ලුණු සමාගම යටතට පත් වී ඇත. භාණ්ඩාගාරයේ මූල්‍ය සහය ඇතිව ප්‍රතිසංස්කරණ කටයුතු 80% අවසන් කර ඇත.

මෙම මූල්‍ය වර්ෂයේදී අපට 2019/2020 වසර සඳහා ලුණු මෙට්‍රික් ටොන් 2786ක් මන්නාරම ලුණු ලේවායේ නිශ්පාදනය කළ හැකි වූ අතර එය ඇස්තමේන්තු ගත මෙට්‍රික් ටොන් 5500ක් වූ ඉලක්කයට සාපේක්ෂවයි. තවද අලි මංකඩ ලුණු ලේවායෙහි 2020/2021 වසර සඳහා ලුණු මෙට්‍රික් ටොන් 8,496 ක් නිෂ්පාදනය කිරීමට හැකි වූ අතර එය ඇස්තමේන්තුගත මෙට්‍රික් ටොන් 18000ක ප්‍රමාණයට සාපේක්ෂ වූවකි. COVID-19 වසංගත තත්ත්වය සහ අයහපත් දේශගුණික තත්ත්වයන් හේතුවෙන් නිෂ්පාදන අනුපාතයෙහි මෙම පහත බැසීම සිදුවිය. එමෙන්ම මන්නාරම ලුණු ලේවායෙහි ඇස්තමේන්තුගත ලුණු ප්‍රමාණය වන මෙට්‍රික් ටොන් 5500ට සාපේක්ෂව ලුණු මෙට්‍රික් ටොන් 5,704 ක් ද, අලිමංකඩ ලුණු ලේවායෙන් අපේක්ෂිත ලුණු මෙට්‍රික් ටොන් 18,000 සාමාන්‍ය ලුණු, අයඩින් මිශ්‍ර ලුණු, කිලෝග්‍රෑම් 1 පැකට් ලුණු, කාර්මික ලුණු සහ ඇඹරූ ලුණු ලෙස ද අලෙවි කරමින් වර්ෂය තුල රු. මිලියන 201.56ක ශුද්ධ පිරිවැටුමක් අත් කරගෙන ඇත. සකස් කර ඇති ගිණුම් අනුව මෙම වසරේ බදු පෙර ශුද්ධ ලාභය රුපියල් 70,168,530 කි.

අපගේ සමාගම විසින් සාධාරණ මිලට අපගේ පාරිභෝගිකයින්ට ලුණු සැපයීමේ සේවාවන් හි නිරත වනවා පමණක් නොව, ආදායම් බදු ලෙස රුපියල් මිලියන 10.53 ක් රජයට ගෙවා ඇති බව අපි ඉතා සතුටින් දන්වා සිටින අතර, තවදුරටත් භාණ්ඩාගාරය වෙත ලැබිය යුතු සාධාරණ ලාභාංශ මුදල ද ගෙවනු ඇත.

මාන්තායි ලුණු සමාගම 2024 දී වෙළඳපල කොටසෙන් 18% ක් අත්කර ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ලුණු නිෂ්පාදකයෙකු බවට පත් වීම කළමනාකාරිත්වයේ ඉලක්කය වී ඇත.

නියමිත ඉලක්කය සඳහා පුහුණුවීම්, ඇගයීම්, මූලික පහසුකම් සඳහා ප්‍රතිපාදන සැලසීම, ප්‍රසාද දීමනා පහසුකම් සහ යනාදී විවිධ ක්‍රියාකාරකම් තුළින් මෙම මූල්‍ය වර්ෂය තුල වර්තමානයේ අප වෙත සිටින කාර්ය මණ්ඩලය බල ගන්වා ඇත.

අවසාන වශයෙන් කර්මාන්ත අමාත්‍යාංශයෙහි ගරු අමාත්‍යවරයා සහ ලේකම්වරයාටත්, සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මගේ කාර්ය මණ්ඩලය වෙතත් මෙම සමාගමේ සාර්ථකත්වය සඳහා සපයන ලද ඔවුන්ගේ හෘදයාංගම දායකත්වය වෙනුවෙන් ස්තුතිවන්ත වීමට මෙය අවස්ථාව කර ගනිමි.

එම්.ජේ. තුවාන් මන්සිල්,

සාමාන්‍යාධිකාරී

3. සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම	සී / ස මාන්තායි ලුණු සමාගම (රාජ්‍ය සමාගමකි)
රේඛීය අමාත්‍යාංශය	කර්මාන්ත අමාත්‍යාංශය
ප්‍රධාන කාර්යාලය	561/3, ඇල්විටිගල මාවත කොළඹ 05.
මන්නාරම ලුණු ලේවාය	ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම
අලි මංකඩ ලුණු ලේවාය	A9 මාර්ගය, අලි මංකඩ, කිල්ලිනොච්චි
සමාගමේ ලියාපදිංචි අංකය	[N(PBS)942] නව අංකය. PB 1078
පාර්ෂවකරුවන්	මහා භාණ්ඩාගාරය
අධ්‍යක්ෂ මණ්ඩලය	1. එච්. ජී. විජේතුංග මහතා - සභාපති 2. ආර්. ඩී. එම්. යූ. එස්. සී. බණ්ඩාර මහතා - මහා භාන්ඩාගාරය 3. ඩබ්. පී. හපුආරච්චි මහතා 4. ශාන්ත කුමාර මහතා 5. එස්. එම්. ජේ. ධර්මකීර්ති මහතා
නිරීක්ෂක	එස්. ජයසේන මිය - නිරීක්ෂක
අධ්‍යක්ෂ	කෝපරේට් ඇෆෙයාර්ස් (පුද්.) සමාගම (Corporate Affairs (Pvt) Ltd.)
විගණක	රජයේ විගණකවරු ජාතික විගණන කාර්යාලය, ශ්‍රී ලංකාව
බැංකුකරු	ලංකා බැංකුව

4. හැඳින්වීම

4.1 සමාගම් පැතිකඩ

මාන්තායි ලුණු සමාගමට ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ දීර්ඝ ඉතිහාසයක් ඇත. එය සාමාන්‍ය ලුණු, අයඩින් මිශ්‍ර ලුණු, කුඩු ලුණු සහ කාර්මික ලුණු නිෂ්පාදනයෙහි නියුතු වේ. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශය මන්නාරම සහ අලිමංකඩ ප්‍රදේශයන් හි පිහිටා ඇති අතර එහි පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත. අලිමංකඩ ලුණු ලේවාය නැවතත් සමාගමේ පරිපාලනයට නතු කර ඇති අතර නිෂ්පාදන ක්‍රියාවලිය 2016 මැද භාගයේ සිට ආරම්භ විය.


ලුණු සංස්ථාව 1938 දී ආරම්භ කරන ලද අතර විවිධ පරිපාලන පාලනයන් හරහා ගොස් අවසානයේ එය 2001 වර්ෂයේ සිට මාන්තායි ලුණු සමාගම ලෙස නම් කරන ලද අතර දැන් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. අමු ලුණු රටේ අනෙකුත් ප්‍රදේශවල අස්වනු නෙළන ලද ලුණු හා සසඳන විට ගුණාත්මක බවින් හොඳම තත්ත්වයේ පවතින බව (96.5.% Nacl) පිළිගැනේ.

මන්තායි ලුණු සමාගම ස්වභාවික සම්පත් උපයෝගිතා මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල අවදානමට ලක්වූ ජනතාවට රැකියා අවස්ථා ලබාදෙන ආයතනයක් ලෙස ද කටයුතු කරයි. අද වන විට ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය 57 ක් සිටින අතර අස්වනු නෙලන කාලයේ දී සේවයේ නියුතු වන කාර්ය මණ්ඩලය 150 ක් ලෙස සේවය කරයි. මාන්තායි ලුණු සමාගම භාණ්ඩාගාරය සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන නියෝජනය කරන සාමාජිකයින්ගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පාලනය වන අතර එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනේ. අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ පොදු ව්‍යවසාය අංශය සමාගමේ නීතිමය සහ වගවීමේ කටයුතු සඳහා අධීක්ෂණයෙන් සහ පහසුකම් සැලසීමෙන් සහාය දක්වයි. එය රජයේ ව්‍යවසායක් වන බැවින් සීමාසහිත සමාගමක් ලෙස 2007 අංක 7 සමාගම් නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම පිණිස සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත. මේ අතර, අගය එකතු කළ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ආයතනය සහතික කර ඇත. තවද සමාගම 2015 වසරේ සිට රජයේ විගණකවරුන් විසින් විගණනය කරනු ලැබේ.

ඓතිහාසික පැතිකඩ

වර්ෂය		ආයතනයේ නම
සිට	දක්වා	
1938	1965	ලුණු දෙපාර්තමේන්තුව
1966	1990	ශ්‍රී ලංකා ජාතික ලුණු සංස්ථාව
1991	1996	ලංකා ලුණු සමාගම
1997	2001 / සැප්.	මන්නාරම ලුණු ලේවාය මන්නාරම දිස්ත්‍රික් ලේකම් යටතේ පැවතිණ
2001 / ඔක්.	අද දක්වා	මාන්තායි ලුණු සමාගම (උතුරු පළාතේ ලුණු ලේවායන්)

ආයතනික දැක්ම



ව්‍යාපාරයේ ස්වභාවය අනුව සමාගම පහත දැක්මෙහි පිහිටා කටයුතු කරයි.

“රසායනික සහ අනෙකුත් ක්‍රියාවලින් හා සබැඳි ස්වභාවික සම්පත් ගවේශනයෙන් සහ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම තුලින් උතුරු පලාත තුල ලුණු - පදනම් කරගත් ව්‍යාපාර සංවර්ධනය කිරීම”.

මෙහෙවර ප්‍රකාශය

සමාගමෙහි මෙහෙවර ප්‍රකාශය පහත පරිදි වේ.

“ලුණු ලේවායන් මෙහෙයවීම, ලුණු සහ අතුරු නිපැයුම් නිෂ්පාදනය කිරීම, අගය එකතු කිරීම සහ අලෙවිය”

4.2 <u>නිශ්පාදන ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු</u>

අ) මන්නාරම ලුණු ලේවාය

මන්නාරම ලුණු ලේවායේ සම්පූර්ණ නිෂ්පාදන ප්‍රමාණය අක්කර 163 ක වපසරියකි. වාර්ෂික ලුණු නිෂ්පාදනය දළ වශයෙන් මෙ.ටොන් 6000ක් වන අතර එය ශ්‍රී ලංකාවේ සමස්ත ලුණු නිෂ්පාදනයෙන් 3.3%කි. එය ලාභ ලබන ආයතනයක් බැවින් කාර්ය මණ්ඩල වැටුප් හා සුබසාධන කටයුතු සමඟින් යම් සංවර්ධන හා නඩත්තු කටයුතු ද එම ලාභය හරහා සිදු කිරීමට සමත් වේ.

ආ) අලි මංකඩ ලුණු ලේවාය

අලිමංකඩ ලුණු ලේවායේ සම්පූර්ණ මෙහෙයුම් ප්‍රමාණයේ වපසරිය අක්කර 750 ක් වන අතර නිෂ්පාදන ධාරිතාව සාමාන්‍යයෙන් වසරකට මෙට්‍රික් ටොන් 25000 කි.

ලුණු ලේවාය 80%ක් දක්වා සාර්ථකව ප්‍රතිසංස්කරණය කර ඇති අතර නිෂ්පාදන ක්‍රියාවලිය 2016 වසරේ ආරම්භ කර 2019/20 වන විට මෙට්‍රික් ටොන් 16,089ක නිෂ්පාදන ධාරිතාවක් සාක්ෂාත් කර ගෙන ඇත.

ලුණු ලේවාය දෙකම වර්තමානයේ සාමාන්‍ය ලුණු නිෂ්පාදනයෙහි නියුතු වන අතර නුදුරු අනාගතයේ දී මේස ලුණු බල යන්ත්‍රාගාර ස්ථාපනය කිරීම ඔස්සේ මහා පරිමාණ අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් කරා අවතීර්ණ වීමට සූදානම් වේ.

4.3 නිශ්පාදන තොරතුරු

ලේවාය	2016/2017	2017/2018	2018/2019	2019/2020	2020/2021
මන්නාරම	6045	6284	6249	6683	2,786
අලි මංකඩ	1048	7130	10314	16089	8,496
එකතුව	7093	13414	16,563	22772	11,282

4.4 විකුණුම්

වර්ෂය	විකුණුම් (මෙ. ටොන්)	Revenue(MN) Rs
2015/2016	5063	62.3
2016/2017	3337	93.8
2017/2018	6094	83.7
2018/2019	16,146	155.38
2019/2020	13,063	103.47
2020/2021	23,484	201.56

5 <u>යෝජිත අනාගත සංවර්ධන බල යන්ත්‍රාගාරය</u>

අ) මන්නාරම ලුණු ලේවාය

1) සමාගම විසින් සාර්ථකව පැයට මෙට්‍රික් ටොන් 2 (2MT /H) ධාරිතාවෙන් යුතුව කැට ලුණු නිෂ්පාදනය කරනු ලබන යන්ත්‍රාගාරයක් ස්ථාපනය කර මේ වන විට ඇසුරුම් කිරීමේ කාර්යය ආරම්භ කොට ඇති අතර දිස්ත්‍රික්කයේ බෙදාහරින්නන් / තොග ගැනුම්කරුවන් හරහා විකුණුම් ආරම්භ කර ඇත.

   වසරකට මෙට්‍රික් ටොන් 3000ක කැට ලුණු ඇසුරුම් කිරීමේ ක්‍රියාවලියක සමාගම නියුතු වී සිටින අතර ඒකක අලෙවි හා විකුණුම් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක ද නියුතු වෙමින් සිටී.. තවද, මේස ලුණු යන්ත්‍රාගාරයක් පවත්නා යන්ත්‍රාගාරයට එකලස් කොට එය නවිකරණය කිරීමෙන් මේස ලුණු සකස් කිරීමට ද සැලසුම් සකස් කොට ඇත.

2) මන්නාරම ලුණු ලේවායෙහි පරිපාලන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සිදු කළ යුතුව ඇත.
3) මන්නාරම ලුණු ලේවායෙහි ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සිදු කළ යුතුව ඇත.

ආ) අලි මංකඩ ලුණු ලේවාය

1. අක්කර 750ක වපසරිය තුල නිෂ්පාදන කටයුතු උපරිම ධාරිතාවෙන් යුතුව සිදු කිරීම සඳහා ලුණු ලේවාය උපරිම ධාරිතාවෙන් පුනරුත්ථාපනය කිරීම

2. පැයට මෙට්‍රික් ටොන් 5ක (5MT/H) ධාරිතාවෙන් යුතු මේස ලුණු නිෂ්පාදන බලාගාරයක් ස්ථාපනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

5.1 මෙම සංවර්ධන කාර්යයන් හි සැළකිය යුතු ප්‍රතිදානය

- නව කම්හල මගින් කැට කරන ලද ලුණු නිෂ්පාදනය සහ අලෙවිය මගින් වෙළඳපල කොටස පුළුල් කර ගැනීමේ අභිලාශයෙන් යුතුව පැතිර යමින් සහ පුළුල් කිරීමට උපකාරී වන අතර එමඟින් සමාගමට වෙළඳපොලේ ශක්‍යතාව සහතික කෙරේ.

- වැඩිවන සහ වේගවත් වන විකුණුම් මගින් ගබඩා කිරීමේ හෝ තොග රඳවා ගැනීමේ කාලය අඩු වනු ඇත.

- අවශ්‍යතා පුළුල් කිරීම මත රැකියා අවස්ථා නිර්මාණය කෙරේ.

- වැඩිවන ලාභය සේවකයින්ට වැඩි සුභසාධන පහසුකම් සහ ප්‍රතිලාභ ලබා දීමට හේතු වේ.

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අවශ්‍යතාවය සපුරාලනු ලබන අතර ප්‍රමිතිය පවත්වාගෙන යනු ලැබේ.

- නිෂ්පාදනය සහ සිල්ලර වෙළඳාම සාධාරණ මිලකට ග්‍රාමීය වෙළඳපොලේ නිෂ්පාදන ලබා දීමෙන් අයඩින් ඌනතාවයේ ගැටලුව මුලිනුපුටා දැමීමට හැකි වේ.

- මහා භාණ්ඩාගාරය වෙත සැලකිය යුතු ලාභාංශයක් ගෙවනු ලබන අතර මහජනතාවට අවසාන ප්‍රතිලාභ ගෙන දෙන ජාතියේ සංවර්ධනය සඳහා VAT සහ NBT වැනි බදු රජයට ලැබෙනු ඇත.


6) මුදල් පිළිබඳ විශේෂ තොරතුරු

මාර්තු 31	ඒකකය	2020/2021	2019/2020	2018/2019	**2017/2018**	2016/2017
අවසන් වූ ගිණුම් වර්ෂය						
නිෂ්පාදිතය	මෙට්‍රික් ටොන්	11,283	22,772	16,563	13,414	7,093
විකුණුම්	මෙට්‍රික් ටොන්	23,484	13,063	16,146	6,094	3,337
ආදායම	රු.	201,568,231	103,473,982	155,380,640	83,796,285	93,873,827
දළ ලාභය	රු.	72,039,111	19,170,216	47,041,469	36,053,276	49,613,129
ශුද්ධ ලාභය	රු.	60,170,921	12,796,333	35,176,712	27,789,256	33,516,078
ශුද්ධ වත්කම්						
මුළු ජංගම - නොවන වත්කම්	රු.	276,402,270	149,768,539	198,751,368	160,315,681	116,333,097
මුළු ජංගම වත්කම්	රු.	74,059,721	146,737,592	103,592,678	115,702,454	48,219,902
මුළු ජංගම - නොවන වගකීම්	රු.	(10,003,783)	(9,296,086)	(11,387,535)	(10,433,573)	(9,440,173)
අඩු කළා - ජංගම වගකීම්	රු.	(18,712,426)	(12,657,428)	(19,574,079)	(24,752,393)	(12,105,527)
		321,745,782	**274,552,617**	**271,382,432**	**240,832,169**	**143,007,300**
කොටස් හිමියන්ගේ අරමුදල්						
නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	රු.	30,000,000	30,000,000	30,000,000	30,000,000	30,000,000
සංචිත	රු.	291,745,782	244,552,617	241,382,432	210,832,169	113,007,300
		321,745,782	**274,552,617**	**271,382,432**	**240,832,169**	**143,007,300**
රජයේ ආදායම්						
ආදායම් බදු	රු.	9,997,609	(498,090)	6,559,465	5,237,520	4,869,106
කොටසකට ඉපැයුම්	රු.	**200.56**	**42.65**	**117.25**	**92.63**	**111.72**

7. ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ගේ විස්තර

නම	තනතුර	සුදුසුකම්	මාන්නායි ලුණු සමාගමේ සේවා කාලය
එම්. ජේ. තුවාන් මන්සිල් මහතා	සාමාන්‍යාධිකාරී	BSc. MBA, මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව, ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව AAT-1	2014 සැප්තැම්බරයේ සිට.
ආර්. වී. විනෝහරන් මහතා	කළමනාකරු - මුදල්	ACMA	2017 ජනවාරියේ සිට.
ඒ. කිෂෝදරන් මහතා	කළමනාකරු - ලුණු ලේවාය	B.Sc /PGD	2008 අප්‍රේල් සිට.
ඩී. ජේ. එච්. එස්. පුෂ්ප කුමාර මහතා	සහකාර කළමනාකරු - මුදල්	CASL (Inter)	2019 පෙබරවාරි සිට.
එම්. එෆ්. ෆයිසාල් මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	Dip in Mec Eng.	2010 නොවැම්බර් සිට.
ආර්. ෆාතිමා රාසික් මහත්මිය	සහකාර කළමනාකරු - පාලන	B.A /Dip HR	2016 අගෝස්තුවේ සිට.
එස්. ජේ. ජිනදාස මහත්මිය	අභ්‍යන්තර විගණක නිලධාරී	අ. පො. ස. උසස් පෙළ AAT 1 සහ 2 සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	2012 අප්‍රේල් සිට.
ඊ. විජයන් මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	අ. පො. ස. උසස් පෙළ	2002 අප්‍රේල් සිට.

8. සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
HM 1-3
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -01
HM 1-1
කළමනාකරු - මුදල් 01
MM 1-1
කළමනාකරු - පිරිවැය ගිණුම් 1
MM-1-1
කළමනාකරු - වෙළඳ MM
MM-1-1
කළමනාකරු - ලුණු ලේවාය-02
MM 1-1
කළමනාකරු - පාලන- 01
MM 1-1
අභ්‍යන්තර විගණක -01
MM1-1
සහකාර කළමනාකරු - මුදල් 01
JM-1-1
සහකාර කළමනාකරු - වෙළඳ JM-1-1
සහකාර කළමනාකරු - ලුණු ලේවාය
සහකාර කළමනාකරු - ලුණු ලේවාය
-05
සහකාර කළමනාකරු - පාලන 01
IM1-1
අභ්‍යන්තර විගණන නිලධාරී - 01
තාක්ෂණික නිලධාරී 01 – MA-2-1
ලුණු ලේවාය නිලධාරී (07) MA 2-1
ගබඩා භාරකරු (03)
කළමනාකරණ සහකාර (07
කළමනාකරණ සහකාර (04) MA 1-1
ආරක්ෂක භාර නිලධාරී (OIC) (02) MA 1-2
කළමනාකරණ සහකාර (7)
MA 1-1
කළමනාකරණ සහකාර (01)
MA 1-1
රියදුරු (04)
PL-3
ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (14)
සහකාර කාර්මික නිලධාරී - 03
සහකාර ගබඩා භාරකරු - 03
පොම්ප ක්‍රියාකරු - 08
PL-2
ප්‍රාථමික මට්ටමේ පුහුණු (23)
රියදුරු - 06
කාර්මික නිලධාරී - 2
විදුලි කාර්මික - 3
වැඩ පරීක්ෂක - 8
තාක්ෂණික නිලධාරී 2 (රසායනාගාර හා වාරිමාර්ග)
තාක්ෂණික නිලධාරී - 2
ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (75)
කාර්යාල සහායක - 6
කම්කරු - 61
ආරක්ෂක නියාමක - 08
PL-1

9. <u>අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව</u>

සමාගමෙහි අධ්‍යක්ෂවරුන් විසින් පහත දැක්වෙන පරිදි සිය වාර්තාව සමඟ 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණිත ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශය එක්ව ඉදිරිපත් කරනු ලැබේ.

<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>

සමාලේචිත වර්ෂයේ සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ලුණු නිෂ්පාදනය සහ විකිණීමයි.

<u>මූල්‍ය අංශයේ විශේෂ අවස්ථා</u>

2021 මාර්තු මස 31න් අවසන් වූ වර්ෂය සඳහා

	රු.
ලුණු විකුණුම්	201,568,231
සම්පූර්ණ ආදායම	201,568,231
විකුණුම් පිරිවැය	129,529,120
දළ ලාභය	72,039,111
ශුද්ධ ලාභය / (බදු පසු) අදාල කාලඡේදය සඳහා	
කොටසකට ඉපැයීම්	**60,170,921**
	200.56

අධ්‍යක්ෂවරු.

සමාගමේ 2020 / 21 වර්ෂය සඳහා අධ්‍යක්ෂවරු පහත සඳහන් පරිදි වේ.

1. එච්. ජී. විජේතුංග මහතා - සභාපති
2. ආර්. ඩී. එම්. යූ. එස්. සී. බණ්ඩාර මහතා - මහා භාන්ඩාගාරය
3. ඩබ්. පී. හපුආරච්චි මහතා
4. ශාන්ත කුමාර මහතා
5. එස්. එම්. ජේ. ධර්මකීර්ති මහතා

එස්. ජයසේන මිය - නිරීක්ෂක

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය

අධ්‍යක්ෂවරු විසින් සමාගමේ එකදු කොටසකවත් හිමිකාරීත්වයක් නොදරයි.

කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සැලකිල්ල

සමාගමෙහි කිසිදු කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ වරුන්ගේ සෘජු හෝ වක්‍ර සැලකිල්ලක් නොමැත.

විගණකවරු

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලය සමාගමෙහි විගණකවරයා ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ විධානය ප්‍රකාරව

සමාගම් ලේකම්

විගණිත ගිණුම්

2020/2021

ජාතික විගණන කාර්යාලය

PAS/B/MSL/01/21/01 2022 ජූනි මස 07 වන දින දී ය.

සභාපති

මාන්තායි ලුණු සමාගම

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 12 ඡේදය ප්‍රකාරව 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මාන්තායි ලුණු සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කරන ලද මතය

2021 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා මාන්තායි ලුණු සමාගමේ ("සමාගම") හි මූල්‍ය ප්‍රකාශනයන් ට ඇතුලත් 2021 මාර්තු 31 දිනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය, ආදායම් විතැන් වීම පිළිබඳ ප්‍රකාශය මෙන්ම මුදල් ප්‍රවාහ ප්‍රකාශය මෙන්ම සුවිශේෂී ගිණුම්කරණ ප්‍රමිතීන් හි සාරාංශය ඇතුලත් මාන්තායි ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි ප්‍රතිපාදන සමඟ එක්ව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තියෙන් සම්පාදිත ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියෙන් සම්පාදිත ප්‍රතිපාදන ප්‍රකාරව නිසි කළට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත.

මගේ මතයට අනුව, මගේ වාර්තාවේ තත්ත්වාගණනය කරන ලද මතය කොටසෙහි පදනම සඳහා වන පදනම විස්තර කරන ලද කරුණු වල බලපෑම හැරුණු විට 2021 මාර්තු 31 දිනට සමාගමෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතය / අදහසක් මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් ලබා දේ. තවද එහි මූල කාර්යසාධනය සහ ප්‍රවර්තන වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සැකසී ඇත.

1.2 තත්ත්වාගණනය කරන ලද මතය සඳහා පදනම

(අ) නියැදි විගණන පරීක්ෂාවක දී අනාවරණය වූ පරිදි රු. 6,828,395ක පිරිවැයකින් යුතු වූ සම්පූර්ණ වත්කම් ප්‍රමාණය 2021 මාර්තු 31 දිනැතිව අලි මංකඩ ලුණු ලේවායෙහි තොග සමීක්ෂණ වාර්තා වලට අනුව ඇතුලත් කොට නොමැති විය.

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි 7.2 ඡේදය ප්‍රකාරව මාස තුනක් හෝ ඊට අඩු කාලයක් තුල කෙටි කාලීන කල් පිරීමකට පත්වන ආයෝජනයක් මුදල් හෝ මුදල් සමාන ලෙස සැලකිය යුතුය. ඊට පටහැනි වෙමින් මාස තුනක් ඇතුලත කල් පිරෙන රු. 10,427,739ක් වටිනා ස්ථාවර තැන්පතු ජංගම - නොවන වත්කම් ලෙස සලකා ඇත.

(ඇ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි 7.8 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් වක්‍ර ක්‍රමවේදයට අනුව සකසන අවස්ථාවක දී මුදල් - නොවන අයිතම ගැලපිය යුතුය. කෙසේ නමුදු, සමාගම විසින් 2021 මාර්තු 31 දිනට සම්පූර්ණ පොළී ආදායම වන රු. 4,874,173, රු. 1,365,944 ක් වන ලද පොළී ආදායම් හඳුනා ගැනීමකින් තොරව සැලකිල්ලට ලක්කොට ඇත.

(ඈ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි 17.21 ඡේදය ප්‍රකාරව වත්කම් වල ප්‍රයෝජ්‍ය ජීව කාලය තීරණය කිරීමේදී, සමාගම විසින් වත්කමෙහි අපේක්ෂිත භාවිතය, අපේක්ෂිත භෞතික කාලය හා අබලි වීම, නිෂ්පාදනයේ වෙනස් කිරීම් හෝ ප්‍රවර්ධනය කිරීම් නිසා ඇති

වූ තාක්ෂණික හෝ වාණිජ යල්පිනූ තත්ත්වයන් සැලකිල්ලට ගත යුතු වේ. එයට විරුද්ධ තත්ත්වයක් දරමින් සමාගම විසින් ගොඩනැගිලි හැර සියලු දේපල පරියත හා උපකරණ සඳහා සියයට දහයක (10) ක්ෂය අනුපාතයක් භාවිතා කොට ඇත. තවද, සමාගම විසින් උක්ත දක්වන ලද කරුණු මත බලපෑම් ඇති කරනු ඇති දර්ශකයන් ඇගයීමට කටයුතු කර නොමැති අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි 17.19 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයෙහි අවසානය දක්වා වූ රු. 4,848,895ක වත්කම් වල සක්‍රීය ආයු කාලය සංශෝධනය කිරීම පිණිස කටයුතු නොකොට මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට ඒවා සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීම මගින් ප්‍රමිති අනුකූල කර ගැනීමෙන් වැලකී සිට ඇත.

(ඉ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි 17.33 ඡේදය ප්‍රකාරව අදාල දක්වන ලද ප්‍රමාණයන්ගෙන් දේපල, පිරියත සහ උපකරණ අයිතම අදාල ප්‍රමාණයන්ගෙන් දක්වන ලද්දේ නම්, සමාගම විසින් නැවත තක්සේරු කිරීමේ සාර්ථක දිනයක්, තක්සේරුකරුගේ විස්තර, හඳුනාගත් එක් එක් වටිනාකම් සහ නැවත තක්සේරු කිරීමේ අතිරික්තය අනාවරණය කිරීම සිදු කළ යුතුය. එයට විරුද්ධ ලෙස සමාගම විසින් ප්‍රාග්ධනය සහ සංචිත යටතේ රු. 2,400,000ක නැවත තක්සේරු කිරීමේ වටිනාකම සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් සපයා නොමැත.

(ඊ) කෙසේ වෙතත්, මන්නාරම සහ අලි මංකඩ ලුණු ලේවායන්හි ඉඩම් වල සහ ගොඩනැගිලි වල සහ ව්‍යුහයන්ගේ ලිඛිත වටිනාකම රුපියල් 42,900,000 ක් සහ රු. 30,593,166 ක් 2021 මාර්තු 31 වැනි දිනට මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ පෙන්වා දී තිබූ අතර ඉඩමේ අයිතිය සමාගමේ නමට පවරා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිල්ලේ ක්ෂයවීම රුපියල් 1,489,485 කින් වැඩිපුර දක්වා ඇති බව ප්‍රකාශ කර ඇත්තේ සියයට 10 ක් ක්ෂයවීම් අනුපාතය හේතුවෙන් මන්නාරම සහ අලි මංකඩ ලුණු ලේවායන් හි ගොඩනැගිලි ක්ෂයවීම් සඳහා පෙර තීරණය කළ සියයට 5 ක ක්ෂයවීම් අනුපාතය වෙනුවට භාවිතා කර ඇති බැවිනි.

(ඌ) අලිමංකඩ ලුණු ලේවාය ප්‍රතිසංස්කරණ කටයුතු ඉටු කිරීම සඳහා 2020 මාර්තු 31 දිනට ලැබුණු සමුච්චිත රජයේ ප්‍රදානය රුපියල් 96,261,491 කි. මෙම ප්‍රදානයන් පිළිවෙළින් රුපියල් 29,518,037, රුපියල් 57,320,658 සහ රුපියල් 9,422,796 ලෙස ගොඩනැඟිලි ඉදිකිරීම, ලුණු ලේවාය ප්‍රතිසංස්කරණය කිරීම සහ වත්කම් ලබා ගැනීම සඳහා භාවිත කර ඇත. කෙසේ නමුදු, සමාගම මූල්‍ය ප්‍රකාශනවල අදාළ බාණ්ඩ යටතේ මෙම වත්කම් වෙන වෙනම හඳුනාගෙන නොතිබූ අතර අලිමංකඩ ලුණු ලේවාය පුනරුත්ථාපනය කිරීම සහ වාර්ෂිකව සියයට 10 ක අනුපාතයකින් ක්ෂය වී ඇති බවට සමුච්චිත සංඛ්‍යා පෙන්වයි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 මාර්තු 31 දිනට ගොඩනැගිල්ලේ සමුච්චිත ක්ෂයවීම් රුපියල් 5,903,607 කින් වැඩි කර පෙන්වා ඇත.

(එ) අලිමංකඩ ලුණු ලේවායේ ඇති ලුණු තොගයේ වෙනස මෙට්‍රික් ටොන් 1126 ක් වන අතර එය අවසන් තොගවලින් සියයට 24 ක් නියෝජනය කරන අතර දළ වශයෙන් රුපියල් 7,741,250 ක් සහ මන්නාරම ලුණු තොගයේ වටිනාකම රුපියල් මෙට්‍රික් ටොන් 281 ක් වන අතර එහි වටිනාකම රු.1,931,875ක් විය. 202I මාර්තු 31 දිනට භෞතික සත්‍යාපන වාර්තා සහ පොත් ශේෂයන් අතර වෙනසක් ලෙස නිරීක්ෂණය විය. කෙසේ නමුදු, පෙර වසරවල ද එම ගැටළුව පැවතියද සමාගම වෙනස නිවැරදි කර නොතිබුණි.

(ඒ) 2017 අංක 24 දරණ දේශීය ආදායම් බදු පනතේ l1(1) වගන්තිය ප්‍රකාරව, වසර තුළ දරණ ලද පරිදි පුද්ගලයකුගේ ආදායම සහ වියදම ගණනය කිරීමේ දී, සහ ආදායම් ගණනය කිරීමේ දී ව්‍යාපාරයෙන් හෝ ආයෝජනයෙන් ලැබෙන ආදායම අඩු කළ යුතුය. ඊට පටහැනිව සමාගම විසින් 2021 මාර්තු 31 වන දින වන විට කර තිබූ පාරිතෝෂික ගෙවීමක් වන රු. 609,015ක ප්‍රමාණයක් අඩු කර නොතිබුණි. ගැලපුම් කරන ලද ව්‍යාපාර ලාභය සහ බදු අය කළ හැකි ආදායම සමාන ප්‍රමාණයකින් වැඩිපුර දක්වා ඇති අතර සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බද්ද ද රු. 85,262 ක් ලෙස වැඩිපුර දක්වා ඇත.

(ඔ) 20l7 හි අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 16 (2) (ආ) වගන්තිය අනුව, ප්‍රාග්ධන දීමනාව තක්සේරු කළ වර්ෂය අවසානයේදී සමාගම විසින් හෝ භාවිතා කරන ලද ක්ෂය කළ හැකි වත්කම් සඳහා අඩු කළ හැකිය. ඊට පටහැනිව සමාගම විසින් රජයේ ප්‍රදාන රු. 9,422,796ක් භාවිතා කරමින් 2016 /17 සිට 2018 / 19 දක්වා වත්කම් මිලදී ගෙන පැවතිණ. කෙසේ නමුදු, මෙම වත්කම් වටිනාකම් ප්‍රාග්ධන

දීමනා ලෙස තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීම සඳහා සලකා නොතිබුණි. එබැවින්, තක්සේරු කළ හැකි ආදායම රු. 1,884,559 කි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආදායම් බදු සඳහා ප්‍රතිපාදන ප්‍රකාශ කර අවසන් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු. 263,838 ක් වී තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය තුළ අලෙවි වූ කොටස් වාර්තා අනුව විකුණූ තොගය මෙට්‍රික් ටොන් 24,590 ක් වූ අතර සහ විකුණුම් වාර්තාවට අනුව, වසර තුළ අලෙවි වූ තොගය මෙට්‍රික් ටොන් 23,508ක් විය. එබැවින්, අලෙවි කළ ලුණු තොගයේ වෙනස මෙට්‍රික් ටොන් 1,082ක් වූයෙන් ආසන්න වටිනාකම රු. 7,439,357 ක් ලෙස තොග වාර්තා සහ විකුණුම් වාර්තා අතර නිරීක්ෂණය වූ අතර වෙනසට හේතු නිරීක්ෂණය නොකර ඇත.

(ක) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන බදු මාර්ගෝපදේශයට අනුව, ව්‍යාපාරයෙන් ලැබෙන ලාභය සහ ලාභය මත යෙදිය යුතු බදු අනුපාත සියයට 14ක් වූ අතර 2020 / 2021 තක්සේරු වර්ෂය සඳහා ව්‍යාපාර ආදායම හැර අනෙකුත් ආදායම සියයට 24ක් විය. කෙසේ වුවද, වෙනත් ආදායම් සඳහා සමාගම විසින් සියයට 24 වෙනුවට සියයට 28ක් අනුකූල කර ඇත. (ස්ථිර තැන්පතු සහ ඉතිරිකිරීමේ ගිණුම් වලින් ලැබෙන පොලී ආදායම). එබැවින්, පුනරුත්ථාපනය යටතේ වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදන රු. 253,780ක් ලෙස වැඩියෙන් සහ සමාලෝචිත වර්ෂය සඳහා ඒ සමාන මුදලකින් ලාභය අඩුවෙන් දක්වා ඇත.

(ග) ජල නල පද්ධතිය එළීම සඳහා අලිමංකඩ ලුණු ලේවායේ කැණීම් කටයුතු සඳහා වැය වූ මුදල රුපියල් 136,000ක මුදල නඩත්තු වියදම් ලෙස ගණන් නොගෙන නිෂ්පාදන පිරිවැය යටතට ඇතුළත් කර තිබුණි. එබැවින්, අලිමංකඩ ලුණු ලේවායේ නිෂ්පාදන පිරිවැය අධික ලෙස ප්‍රකාශ කර ඇති අතර පරිපාලන වියදම් ද ඒ හා සමාන ප්‍රමාණයකින් අඩු කර තිබුණි.

මම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව මගේ විගණනය සිදු කළෙමි. මගේ වගකීම්, එම ප්‍රමිතීන් යටතේ මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම් කොටසෙහි තවදුරටත් විස්තර කර ඇත. මගේ තත්ත්වාගණනය කරන ලද මතය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

1.3 සමාගමෙහි 2020 / 21 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කොට ඇති අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට සමාගමේ 2020 / 21 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු ඇතුළත් නමුත් මෙම විගණක වාර්තාවේ දිනයෙන් පසුව මට ලබා දීමට අපේක්ෂා කෙරෙන මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මගේ විගණක වාර්තාව ඇතුළත් නොවේ. අනෙක් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතය අනෙකුත් තොරතුරු මගින් ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික කිරීමේ නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ඒවා කියවීම සහ එසේ කිරීමේදී, අනෙකුත් තොරතුරු විගණන ප්‍රකාශනවලට හෝ විගණනයේදී ලබාගත් මගේ දැනුමට ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න සලකා බැලීමයි. එසේ නොමැති නම් ද්‍රව්‍යමය වශයෙන් වැරදි ලෙස ප්‍රකාශිත බව පෙනේ.

මම සමාගමේ 2020 / 21 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා එම කාරණය පාලනයට සම්බන්ධ අය වෙත දැනුම් දීමට මට අවශ්‍ය වේ. තවදුරටත් ප්‍රමාණාත්මක නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ තිබේ නම්, ඒවා නියමිත වේලාවට සභාගත කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මගේ වාර්තාවේ ඇතුළත් කරනු ලැබේ.

1.4 කළමනාකරණයේ වගකීම් සහ මූල්‍ය ප්‍රකාශන පාලනය කිරීම සඳහා බලතල ලද්දවුන් ගේ වගකීම්

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා කළමනාකරණය වගකිව යුතු වන අතර එවැනි අභ්‍යන්තර පාලනයක් පැවතිය යුතු බවට කළමනාකාරීත්වය තීරණය කරනු ලැබ මූල්‍ය ප්‍රකාශන සැකසීමට හැකිවීම සඳහා අභ්‍යන්තර පාලනයක් පැවතිය යුතු වීම වංචා හෝ වැරදි කරණ කොට ගෙන වැනි ද්‍රව්‍යාත්මක තත්ත්වයන්ගෙන් බැහැර කරුණකි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සමාගමේ අඛණ්ඩතා පැවැත්ම, විධිමත් පරිදි අනාවරණය කිරීම, යෝග්‍ය පරිදි සිදු කිරීම, අඛණ්ඩතා පැවැත්මට අදාල කරුණු සහ කළමනාකරණය විසින් සමාගම ඇවර කිරීමට හෝ නැවැත්වීමට අදහස් කරන්නේ නම් මිස, අඛණ්ඩතා පැවැත්ම ලෙස ඉදිරියට යාමට සමාගමට ඇති හැකියාව තක්සේරු කිරීමේ වගකීම පැවරී ඇති බැවින් ඒ හැර යථාර්ථවාදී විකල්පයක් නැත.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලන බලතල ලද්දවුන් වගකීමෙන් බැඳී සිටී.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට ප්‍රකාරව, වාර්ෂික සහ කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි, සමාගම විසින් සිය සියලු ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශකයින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයෙන් තොර බවට සාධාරණ සුරක්ෂිතබවක් ලබා ගැනීම සහ මගේ මතය ඇතුළත් විගණක වාර්තාවක් නිකුත් කිරීම මගේ අරමුණ වේ. සාධාරණ සහතිකයක් යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකරනු ලබන විගණනයකදී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් පවතින විට එය සැමවිටම අනාවරණය වන බවට සහතිකයක් නොවේ. සාවද්‍ය ප්‍රකාශයන් වංචාවකින් හෝ දෝෂයකින් මතු විය හැකි අතර, තනි තනිව හෝ සමස්තයක් වශයෙන්, මෙම මූල්‍යමය පදනම මත ගනු ලබන පරිශීලකයන්ගේ ආර්ථික තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් කිරීමට ඒවා සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම් ඒවා ද්‍රව්‍යමය ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාවටම වෘත්තීය සංශයවාදය පවත්වාගෙන යමි. තවද,

- වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම හඳුනාගෙන තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සහ මගේ මතයට පදනමක් සැපයීමට යෝග්‍ය සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම. වංචාව නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් අනාවරණය කර නොගැනීමේ අවදානම දෝෂයක් නිසා ඇති වූ ප්‍රතිඵලයකට වඩා වැඩිය, වංචාවට හවුල් වීම, ව්‍යාජ ලෙස සකස් කිරීම, චේතනාන්විත අතපසුවීම්, වැරදි අර්ථ නිරූපණයන් හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම ඇතුළත් විය හැකි බැවින්.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, තත්වයන්ට උචිත විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අන්තර් පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා.

- භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද ගිණුම් ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම් වල සාධාරණ බව ඇගයීම.

- සමාගමට ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ තත්ත්වයන් සම්බන්ධයෙන් ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණයේ පවතින සැලකිල්ලේ පදනම කළමනාකරණය විසින් භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන්න. ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පවතින බව මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් හෝ, එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීමට මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීමට මට අවශ්‍ය වේ. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ කොන්දේසි සමාගමෙහි ඉදිරියට යාමේ ගැටලුවක් ලෙස දිගටම නතර වීමට හේතු විය හැක.

- හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍යයේ සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන ආකාරයෙන් ගනුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරන්න.

මගේ විගණනය අතරතුරදී මා විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු දුර්වලතා ඇතුළුව, අනෙකුත් කරුණු අතර, සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන්, පාලනය සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ අය සමඟ මම සන්නිවේදනය කරමි.

2. අනෙකුත් නෛතික සහ නියාමන වගකීම් පිළිබඳව වාර්තා කිරීම

2.1 පහත අවශ්‍යතා සඳහා සුවිශේෂී ප්‍රතිපාදන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අන්තර්ගත වේ.

2.1.2 තත්ත්වාගණනය කරන ලද මතයට පදනම ඡේදයේ විස්තර කොට ඇති කරුණු වල බලපෑම හැරුණු විට, විගණනය සඳහා අවශ්‍ය වන්නා වූ සියලු තොරතුරු හා අදහස් දැක්වීම් මා විසින් ලබාගෙන ඇති අතර හැකිතාක් දුරට මගේ පරීක්ෂණය සඳහා පෙනෙන, යෝග්‍ය ගිණුම්කරණ වාර්තා 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තිය ප්‍රකාරව සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 12 (අ) වගන්තිය ප්‍රකාරව සමාගම විසින් සපයා ඇත.

2.1.2 සමාගමෙහි මූල්‍ය ප්‍රකාශය 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 ප්‍රතිපාදනය අනුව අනුගත වෙමින් සකසා ඇත.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රවර්තන වර්ෂය සමඟ අනුකූල වන අතර ඒවා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියෙහි අවශ්‍යතා සපුරාලයි.

2.1.4 ඇතුලත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iv) වගන්තියෙහි අවශ්‍යතාව අනුව මා විසින් පූර්ව වර්ෂයේදී කරන ලද සියලු නිර්දේශ ඇතුලත්ව ඇත.

2.2 ක්‍රියාත්මක කරන ලද පටිපාටි සහ ද්‍රව්‍යාත්මක කරුණු වලට සීමා වී ලබාගත් සාක්ෂි මත පදනම්ව ඇති බව මිස, අන් කිසිවක් මගේ අවධානයට ලක් නොවිණි.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තිය ප්‍රකාරව සමාගම විසින් කෙරෙන ව්‍යාපාරික කටයුතු වලදී පාලන සභාවෙහි යම් සාමාජිකයකු සෘජුව හෝ වක්‍රව සාමාන්‍ය ව්‍යාපාරික පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා

2.2.2 පහත කරුණු හැරුණු විටදී 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියෙන් අපේක්ෂිත පරිදි සමාගමෙහි පාලක සභාව මගින් නිකුත් කළ යම් අදාල කොට ගත හැකි නීතියක්, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් සමාගම විසින් අනුගත කොට නොගැනීම පිළිබඳ දැක්වීමට;

නීතිය / උපදෙස් වලට යොමුව	විස්තරය
2003 ජූනි 02 දිනැති අංක PED 12 දරණ රාජ්‍ය ව්‍යවසාය චක්ලේඛයෙහි 6.5.1 පරිච්ඡේදය	මුදල් වර්ෂය අවසාන වීමෙන් දින 60ක් ඇතුලත රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, සහ මහා භාණ්ඩාගාරය වෙතද පිටපත් සහිතව විගණකාධිපති වෙත වාර්ෂික ගිණුම් ඉදිරිපත් කළ යුතුය. කෙසේ නමුදු, සමාගම විසින් මාස 4කට වඩා ප්‍රමාද කිරීමෙන් අනතුරුව 2021 ඔක්තෝබර් මස 04 වන දින 2021 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කොට තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තිය මගින් අපේක්ෂිත පරිදි සමාගම විසින් සිය බලතල, ක්‍රියාකාරකම් සහ රාජකාරි වලට අනුව කටයුතු කර ඇති බවට දැක්වීම සඳහා

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය මගින් අපේක්ෂිත පරිදි දෙන ලද කාල රාමුව තුල අදාල නීති වලට අනුකූලව සමාගමෙහි සම්පත් ප්‍රසම්පාදනය කොට සහ සකසුරුවම්කමින් යුතුව කාර්යක්ෂමව සහ සාර්ථකව ප්‍රයෝජනයට ගෙන ඇති බවට දැක්වීම සඳහා

3. අනෙකුත් කරුණු

(අ) සමාගම විසින් වසර 03කටද වැඩියෙන් පවත්නා රු. 1,577,310ක් වූ ආර්ථික සේවා ගාස්තු අයකර ගෙන නොමැති අතර රු. 1,193,214ක රැඳවුම් බද්දක් ගෙවා ඇති අතර, රු.673,493ක ගෙවිය යුතු වසර 05කට වඩා පවතින ආදායම් බදු ප්‍රමාණයක් ගෙවීමට පවතී. තවද, අලි මංකඩ ලුණු ලේවාය සඳහා ලැබිය යුතු භාණ්ඩාගාර අරමුදල් රු. 811,706ක ප්‍රමාණයක් වසර 03ක් පුරා එකතු නොකොට පවතී.

(ආ) වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් අතර වසර 06කට වැඩි කාලයක් පවත්නා රු. 100,000ක මුදලක් සමාගම් ලියාපදිංචි ගාස්තු වශයෙන් පවතී.

(ඇ) සාංගමික ගිවිසුමෙහි, අභිලාශ 01ට අනුව, සමාගම විසින් උතුරු පලාත තුල ලංකා ලුණු සමාගම විසින් පවත්වාගෙන යන ලද ව්‍යාපාර කටයුතු ඉදිරියට ගෙන යමින් සිදු කළ යුතුය. කෙසේ නමුදු, එකී ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා පියවර ගෙන නොතිබිණි.

තවද, 2001 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මන්නාරම ලුණු ලේවාය මූලික වශයෙන් මෙහෙයුම් කිරීමටත්, ඒ අනුව චෙම්මානි සහ අරාලි ලුණු ලේවාය ද අනතුරුව මෙහෙයවීමටත් යෝජනා විය. අවසන් වශයෙන් , කුරින්චතිවු සහ අලි මංකඩ ලුණු ලේවායන් හි මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වුවද, 2021 මාර්තු 31 වන දින වන විට මන්නාරම සහ අලි මංකඩ ලුණු ලේවායන් පමණක් සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වැසි දිය නිස්සාරණ යෝජනා ක්‍රමයක් ඉදිකිරීම නිසා චෙම්මානි ඉඩම නැවත ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීමට සිදුවූ අතර, ප්‍රාදේශීය ලේකම් විසින් කසල බැහැර කිරීම සඳහා යොදා ගෙන තිබීම හේතුවෙන් අරාලි ඉඩම අතහැර දැමීමට සිදු විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

මාන්තායි ලුණු සමාගම

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

මාන්තායි ලුණු සමාගම

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් වාර්තාව.

	සටහන්	2021 රු.	2020 රු.
ආදායම්	(3)	201,568,231	103,473,982
විකුණුම් පිරිවැය		(129,529,120)	(84,303,766)
දළ ලාභය		72,039,111	19,170,216
අනෙකුත් මෙහෙයුම් ආදායම්	(4)	16,635,817	12,414,565
		88,674,928	31,584,782
පරිපාලන වියදම්		(17,503,340)	(18,368,420)
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්		(972,613)	(875,422)
මෙහෙයුම් ලාභය		70,198,975	12,340,940
මූල්‍යමය වියදම්	(5)	(30,445)	(42,696)
බදු ගෙවීමට පෙර ලාභය	(6)	70,168,530	12,298,244
ආදායම් බදු	(7)	(9,997,609)	498,090
වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය		60,170,921	12,796,334

මාන්තායි ලුණු සමාගම

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

වත්කම්	සටහන්	2021 රු.	2020 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, යන්ත්‍ර සහ උපකරණ	(8)	140,036,325	149,768,539
මූල්‍යමය වත්කම්	(9)	136,365,944	
		276,402,270	149,768,539
ජංගම වත්කම්			
පරිලේඛණ(ඉන්වෙන්ට්‍රි)	(10)	48,970,652	82,200,826
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	(11)	8,201,861	5,408,790
මුදල් සහ මුදල්වලට සමාන දෑ	(12)	16,887,208	59,127,976
		74,059,721	146,737,592
මුළු වත්කම්		350,461,990	296,506,131.
කොටස් හා වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(13)	30,000,000	30,000,000
		2,400,000	2,400,000
ආදායම් සංචිත	(14)	231,088,916	174,269,603
මුළු ප්‍රාග්ධනය		263,488,916	206,669,603
ජංගම නොවන වගකීම්			
රජයේ ප්‍රදාන	(15)	58,256,865	67,883,015
වලම්බිත බදු බැරකම්	(16)	(612,236)	(70,342)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	(17)	10,616,019	9,366,428
		68,260,649	77,179,100
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවීම්	(18)	15,184,625	13,377,845
ගෙවිය යුතු ආදායම් බදු / (අයකරගත හැකි)	(19)	3,527,801	(720,417)
		18,712,426	12,657,428
සමස්ථ කොටස් සහ වගකීම්		350,461,990	296,506,131

මෙම මූල්‍ය ප්‍රකාශණ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

---------- ----------

මූල්‍ය කළමනාකරු දිනය

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

	නම	අත්සන
අධ්‍යක්ෂ 1	එච්.ජී. විජේතුංග	----------
අධ්‍යක්ෂ 2	ඩබ්.පී. අපැහැදිලියි	----------

අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද දිනය 15.09. 2021

මාන්තායි ලුණු සමාගම

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය.

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණිත සංචිත	ආදායම් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.
2018 අප්‍රේල් 1 වන දිනට ශේෂය	30,000,000	2,400,000	126,296,557	158,696,557
වාර්ෂික ශුද්ධ ලාභය	-		35,176,712	35,176,712
2019 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	2,400,000	161,473,269	193,873,269
වාර්ෂික ශුද්ධ ලාභය			12,796,333	12,796,333
2020 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	2,400,000	174,269,603	206,669,603
වාර්ෂික ශුද්ධ ලාභය		-	60,170,921	60,170,921
ලාභාංශ ගෙවීම්			(3,351,608)	(3,351,608)
2021 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	2,400,000	231,088,916	263,488,916

පිටුව (4)

මාන්තායි ලුණු සමාගම

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය.

	2021	2020
මෙහෙයුම් කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය	රු.	රු.
බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)	70,168,530	12,298,244
ගැලපීම්		
ක්ෂය	5,126,040	4,535,209
පාරිතෝෂික ප්‍රතිපාදන	1,858,606	1,710,305
ස්ථිර තැන්පතු පොලී ආදායම්	(4,874,173)	(628,251)
තැන්පතු පොලී ආදායම්	(1,470,297)	(1,129,436)
	640,176	4,487,827
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර වර්ෂය සඳහා මෙහෙයුම් ලාභය	70,808,706	16,786,070
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්		
පරිලේඛණයන් (ඉන්වෙන්ට්‍රි) හී වැඩිවීම්/(අඩුවීම්)	33,230,174	(21,102,288)
වෙළඳ සහ අනෙකුත් ලැබීම් හී (වැඩිවීම)/ අඩුවීම්	(2,793,071)	3,918,227
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් හී (වැඩිවීම)/ අඩුවීම්	1,806,780	(4,427,769)
	32,243,883	(21,611,830)
	103,052,589	(4,825,759)
මෙහෙයුම් තුලින් ජනනය වූ මුදල්		
පාරිතෝෂික ගෙවීම්	(609,015)	(1,344,026)
ආදායම් බදු/රඳවාගත් බදු ගෙවීම්	(6,291,285)	(4,448,519)
	(6,900,300)	(5,792,544)
මෙහෙයුම් කටයුතු තුලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	96,152,289	(10,618,304)
ආයෝජන කටයුතුවල මූල්‍ය ප්‍රවාහය		
දේපළ, යන්ත්‍ර සහ උපකරණ මිළදී ගැනීම්	(5,019,975)	(9,178,530)

ආයෝජන නැවත ලබා ගැනීම්		44,000,000
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(136,365,944)	-
ස්ථිර තැන්පතු පොලී ආදායම්	4,874,173	628,252
තැන්පතු පොලී ආදායම්	1,470,297	1,129,436
ආයෝජන කටයුතුවලින් ගලා ගිය ශුද්ධ මූල්‍ය ප්‍රවාය	(135,041,450)	36,579,157
මූල්‍ය කටයුතුවල මූල්‍ය ප්‍රවාහය		
රජයේ ප්‍රතිපාදන ලැබීම්	(3,351,608)	
මූල්‍ය කටයුතුවලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(3,351,608)	
වර්ෂය තුළ මුදල් සහ මුදල්වලට සමාන දෑවල ශුද්ධ වර්ධනය	(42,240,768)	25,960,854
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් වලට සමාන දෑ	59,127,977	33,167,123
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	16,887,208	59,127,977
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ විශ්ලේෂණය කිරීම		
බැංකුවේ ඇති මුදල්	16,887,208	59,109,372
අතැති මුදල්		18,605
	16,887,208	59,127,977

මාන්තායි ලුණු සමාගම

2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.

1. සංස්ථාපිත තොරතුරු

1.1 වාර්තාකරණ අස්ථිත්වය

මාන්තායි සෝල්ට් ලිමිටඩ් යනු ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (පූර්ණ වශයෙන් රජයට අයත්) යටතේ ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සීමිත වගකීම් සහිත රාජ්‍ය ව්‍යාපාර සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, ඇල්විටිගල මාවතේ 561/3 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම සහ එලිපන්ට්පාස් යන ස්ථානයන් හී පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ දීර්ඝ ඉතිහාසය ඉදිරියට ගෙන යාමයි. එම ආයතනය සාමාණ්‍ය ලුණු නිෂ්පාදනය කරන අතර ඒවා කැට ලුණු, සහ කාර්මික ලුණු ආකාරයට ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශණයේ අංක (05) සිට (26) දක්වා පිටුවල දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස අකණ්ඩව පවතී.

4. වර්ෂය අවසාන වන විට සේවක සංඛ්‍යාව 57කි (2020-67)

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය.

2 .. 1 සමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශය, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ නිර්ණායකයන්ට අනුකූලව පිරිවැය මත පදනම්ව සකස් කර ඇත.

ඉදිරියට.....

මාන්තායි ලුණු සමාගම

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

2.1.2 සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශණය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශණය ශ්‍රී ලංකා රුපියල්(රු.) වලින් ඉදිරිපත් කරන අතර, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර ඇත.

වර්තමාන නිරූපනය සමඟ සනාත කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාවන් හී වර්තමාන වර්ෂය සඳහා වන ඉදිරිපත් කිරීම් සමඟ ගැලපෙන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය පරදි නැවත වර්ගීකරණ කර නොමති නම් සහ වෙනත් ආකාරයකින් ප්‍රකාශකර නැතිනම් සමාගම විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

2.1.3 අඛණ්ඩතා පැවැත්ම

අධ්‍යක්ෂවරුන් විසින්, සමාගම ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක්කර ඇති අතර, ඔවුන් එය ඇවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට අදහස් නොකරයි.

